කලාප අධ්‍යාපන කාර්යාලය - දෙහිඕවිට
வலயக் கல்வி அலுவலகம் - தெஹியோவிற்ற
Zonal Education Office - Dehiowita

8 ශ්‍රේණිය
Grade - 8

දෙවන වාර පරීක්ෂණය - 2023
இரண்டாம் பருவத் தேர்வு - 2023
Second Term Test - 2023

කාලය - පැ : 2
Time - 2 hour

ඉතිහාසය - I ,II
History - I , II

නම / විභාග අංකය : ....................................................................................... පන්තිය : .....................................

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01.) 1. පණ්ඩුකාභය රජු විසින් ඉදි කරන ලද වැවක් වන්නේ,
1. අභය වාපී 2. ජල්මුර වාපී 3. මයෙන් වැව 4. මානු වාපී

2. මනා පාලනයකින් යුතුව වැවේ ජලය නිකුත් කරනු ලබන්නේ,
1. ගොඩ සොරොව්ව 2. මඩ සොරොව්ව 3. බිසෝ කොටුව 4. වාරි මාර්ග ඇල

3. ශ්‍රී ලංකාවේ පැරණි රාජකීය උද්‍යානයක් වන්නේ,
1. රන් මසු උයන 2. ජෝති උයන 3. නන්දන උයන 4. මහමෙව්නා උයන

4. මහනුවර රාජධානියේ ආරම්භක පාලකයා වූයේ,
1. දෙවන රාජසිංහ රජු 2. පළමුවන විමලධර්මසූරිය රජු
3. සේනාසම්මත වික්‍රමබාහු රජ් 4. සෙනරත් රජු

5. යුරෝපයේ පුනරුදය මුලින්ම ආරම්භ වූ රට වන්නේ,
1. ඉතාලිය 2. ග්‍රීසිය 3. රෝමය 4. ප්‍රංශය

02). පහත සඳහන් ප්‍රකාශ හරිනම් ( √ ) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

6. පුනරුද සමයේ මුද්‍රණ යන්ත්‍රය සොයා ගත්තේ ජොහැන්නස් ගුටෙන්බර්ග් විසිනි ( )
7. මහමෙවුනා උයන දේවානම්පියතිස්ස රජුගේ නිර්මාණයකි ( )
8. පැරණි යකඩ නිස්සාරණ පිළිබඳ සාධක හමුවන ස්ථානයක් වන්නේ බලංගොඩ සමනල වැව ප්‍රදේශයයි ( )
9. කොනොප්පු බණ්ඩාර විමලධර්මසූරිය නමින් රජ වීම උඩරට ඉතිහාසයේ වැදගත් දේශපාලන සිදුවීමකි ( )
10. අවසන් විනිශ්චය චිත්‍රය නිර්මාණය කරන ලද්දේ මයිකල් ආන්ජිලෝ විසිනි ( )

03). (අ) තීරුවට ගැලපෙන පිළිතුර ( ආ) තීරුවෙන් තෝරා නිවැරදිව යා කරන්න.

| | (අ) තීරුව | (ආ) තීරුව |
|---|---|---|
| 11. | ඩේවිඩ්ගේ ප්‍රතිමාව | විලියම් හාවේ |
| 12. | යෝධ ඇල නිර්මාණය | දෙවන රාජසිංහ රජු |

13. මහා අස්ථාන කුමරු ධාතුසේන රජු

14. හුරුළු වැව මයිකල් ආන්ජිලෝ

15. රුධිර සංසරණ පද්ධතිය මහසෙන් රජු

04). ගැලපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

16. කුසුමාසන දේවිය ..........................................නමින් බෞතීස්ම කරන ලදී.
17. .......................................... භාණ්ඩ අලංකාර කිරීමට යොදා ගන්නා ලදී.
18. කොත්මලේ ප්‍රදේශය .................................................. සඳහා ප්‍රසිද්ධය.
19. ..........................................ඉතාලියේ සිටි ප්‍රසිද්ධ ගත් කරුවෙකි.
20. අන්තිම රාත්‍රී භෝජනය චිත්‍රය ..................................................විසින් නිර්මාණය කරන ලදී.

( ලියනාඩෝ ඩිවින්චි, දෙවන කතිරිනා, ඩාන්ටේ , යකඩ කර්මාන්තය, ලාක්ෂා කර්මාන්තය )

(ල. 20x2=40 )

## II කොටස

- පළමුවැනි ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01). අ). ලංකා සිතියමක පහත දැක්වෙන ස්ථාන ලකුණු කරන්න.
මහනුවර, පරාක්‍රම සමුද්‍රය, යාපනය, මල්වතු ඔය, සීගිරිය, මහවැලි ගඟ ( ල. 6 )

ආ). ලෝක සිතියමක පහත දැක්වෙන ස්ථාන ලකුණු කරන්න.
කොන්ස්තන්තිනෝපලය, ඉතාලිය, රෝමය, වැනීසිය, මධ්‍යධරණී මුහුද ( ල. 6 )

ඇ).



i. මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුද ?
ii. ඔහු කුමන ජාතිකයෙක් ද ?
iii. මොහු විසින් නිර්මාණය කරන ලද සිතුවමක් නම් කරන්න.
iv. චිත්‍ර ශිල්පයට අමතරව මොහු විසින් දක්ෂතා පෙන්වන ලද තවත් ක්ෂේත්‍රයන් නම් කරන්න. ( ල. 4 )

ඈ).



i. මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුද ?
ii. එම රජතුමා පාලනය කළ රාජධානිය කුමක්ද ?
iii. ඔහු අයත් රාජවංශය කුමක්ද ?
iv. රජවීමට පෙර හැඳින් වූ නම කුමක්ද ? ( ල. 4 )

02). i. A - ජොන් පිලිප් B - දොන් ජුවන්

යන නම් වලින් පෘතුගීසීන් විසින් බෞතීස්ම කරන ලද පුද්ගලයන් නම් කරන්න. (ල. 2)

ii. පළමුවන විමලධර්මසූරිය රජුගෙන් සිදු වූ සේවාවන් 03 ක් ලියන්න. ( ල. 3 )

iii. උඩරට සහ පෘතුගීසීන් අතර සටන් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න. ( ල. 5 )

| සටන | සිංහල නායකත්වය | පෘතුගීසි නායකත්වය |
|---|---|---|
| දන්තුරේ | A ...................................... | B .................................... |
| C ........................................... | I විමලධර්මසූරිය රජු | දොන් ජෙරනිමෝද අපවේදු |
| D .......................... | E ....................................... | දියෝගු ද මේලෝ |

03). i. මහසෙන් රජු ඉදි කළ වැව් 02 ක් නම් කරන්න. ( ල. 2 )

ii. ලංකාවේ පැරණි පොකුණු තැනවීමේ අවශ්‍යතා 03 ක් ලියන්න. (ල. 3 )

iii. A - වැවක අංග 2 ක් නම් කරන්න.

B - නිසි ප්‍රමිතියකින් යුතුව වැව් බැම්ම ඉදි කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 5 )

04). i. යුරෝපයේ පුනරුද සමයේ සිටි චිත්‍ර ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. ( ල. 2 )

ii. යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 03 ක් සඳහන් කරන්න. (ල. 3 )

iii. A - යුරෝපයේ පුනරුද සමයේ සිටි මූර්ති ශිල්පීන් දෙදෙනෙක් ද

B - යුරෝපයේ පුනරුද චිත්‍ර කලාවේ ලක්ෂණ 03 ක් ද ලියා දක්වන්න. (ල. 5 )

05). i. මහනුවර රාජධානිය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියා දක්වන්න. ( ල. 2 )

ii. මහනුවර රාජධානියේ සිටි නායක්කර් වංශික රජවරු තිදෙනෙක් නම් කරන්න. (ල. 3 )

iii. A - උඩරට සමාජයේ තිබූ විවාහ ක්‍රම 03 ක් ද

B - මහනුවර යුගයේ ආර්ථිකයේ ලක්ෂණ 02 ක්ද ලියා දක්වන්න. (ල. 5 )

06). i. A - වටදාගෙයක් සඳහා උදාහරණයක් දෙන්න.

B - බෝධිඝරයක් සඳහා උදාහරණයක් ද ලියා දක්වන්න. ( ල. 2 )

ii. පහත දැක්වෙන දාගැබ් ඉදි කළ රජවරු ලියා දක්වන්න.

A - ථූපාරාමය

B - ජේතවනය

C - අභයගිරිය (ල. 3 )

iii. A - ශ්‍රී ලංකාවේ පැරණි ආරෝග්‍යශාලා පිළිබඳ සාධක හමුවන ස්ථාන දෙකක් ද

B - ශ්‍රී ලංකාවේ පැරණි පිළිම ගෙවල් ඉදි කළ සම්ප්‍රදායන් තුන ද ලියා දක්වන්න. (ල. 5 )